

සවියෙන් පෙරට - අපි එකට

e-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

# 9 ශ්‍රේණිය: ඉතිහාසය - 1 වාරය

# 1 පාඩම: ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් යටතට පත්වීම

කේ. යූ. පී. අයි. යූ. කාරියවසම්

බප/හො/ සාගර පලන්සූරිය මහා විද්‍යාලය

# හැඳින්වීම

- ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසීන්ගෙන් නිදහස් කර ගෙන ඔවුන් මෙරටින් නෙරපා හැරීමේ අරමුණින් ලන්දේසීන්ගේ සහය ලබා ගැනීමට මෙරට රජවරු කටයුතු කළහ.
- ලන්දේසීහු වර්ෂ 1658 වන විට පෘතුගීසීන් සහමුලින් ම මෙරටින් නෙරපා දැමූ අතර එතැන් පටන් වර්ෂ 1796 දක්වා ඔවුන් මෙරට මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළහ.





ගාලු කොටුව

# ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් යටතට පත්වීම

## ලන්දේසීන් ආසියාවට පැමිණීම

- ස්පාඤ්ඤයේ රජ වූ දෙවන පිලිප් රජු විසින් ලන්දේසීන් ලිස්බන් වරායට පැමිණීම තහනම් කිරීම හේතුවෙන් ඔවුන්ගේ වෙළෙඳාමට අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට නොහැකි වීම.

- විවිධ ඔත්තුකරුවන් යෙදවීම හා වෙනත් මාර්ගවලින් වර්ෂ 1595 පමණ වන විට පෘතුගීසීන් ආසියාවට පැමිණෙන වෙළෙඳ මාර්ග ලන්දේසීන් විසින් සොයා ගැනීම.

- ඕලන්ද පාලකයා 1602 වර්ෂයේ දී ලන්දේසී වෙළෙඳ සමාගම් කිහිපයක් එකතු කොට පෙරදිග ඕලන්ද වෙළෙඳ සමාගම හෙවත් 'VOC' සමාගම පිහිටුවීම.

- 'VOC' සමාගම යටතේ පැමිණි ලන්දේසීහු ජාවා දූපතේ බතාවියේ තම මූලස්ථානය පිහිටුවීම.



පෙරදිග ඕලන්ද වෙළෙඳ සමාගමේ ‘VOC’ ලාංඡනය

# ලන්දේසීන් උඩරට රාජ්‍ය සමඟ පැවැත් වූ සම්බන්ධතා

- මෙරට පාලනය කළ යුරෝපා ජාතීන් අතුරින් උඩරට රාජ්‍ය සමඟ වැඩි කාලයක් යහපත් සබඳතාවයක් පවත්වාගෙන ගිය ජාතිය ලන්දේසීන් වේ

- ලන්දේසි දූතයන් උඩරට රජු අවස්ථා කිහිපයක දී ම මුණ ගැසුණි.

# ලන්දේසි දූතයන් උඩරට රජු හමු වූ අවස්ථා කිහිපයක් පහත දැක් වේ

| වර්ෂය | උඩරට රජු | ලන්දේසි දූතයා | දූත ගමනට හේතුව |
|---|---|---|---|
| 1602 | පළමුවන විමලධර්මසූරිය රජු | ජොරිස් වැන් ස්පිල් බර්ජන් | වෙළෙඳ කටයුතු පිළිබඳව රජු සමග සාකච්ඡා කිරීම සඳහා |
| 1656 | දෙවන රාජසිංහ රජු | ජෙනරල් ජෙරාඞ් හල්ෆ්ට් | රජු බැහැදකින ලෙස ලැබුණු ආරාධනය හා එවකට පැවති ගැටලු සාකච්ඡා කර ගැනීම |
| 1688 | දෙවන විමලධර්මසූරිය රජු | කලන් අල්බස් | රජු හා ලන්දේසීන් අතර නව ගිවිසුමක් ඇති කර ගැනීම ගැන සාකච්ඡා කිරීම |
| 1721 | ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු | කොර්නේලියස් ටැකල් | රජුගේ බිසව මිය යාම ගැන ලන්දේසීන්ගේ ශෝකය ප්‍රකාශ කිරීම |

# දූත ගමන්වල දී තෑගි භෝග හුවමාරු කර ගැනීම

| ලන්දේසි දූතයා රජුට ලබා දුන් තෑගි | රජු ලන්දේසි දූතයාට ලබා දුන් තෑගි |
| --- | --- |
| පෘතුගීසීන්ගෙන් අත් කර ගත් කොඩි<br>අශ්වයන් දෙදෙනෙකු<br>පර්සියානු දූනු ඊතල කට්ටල දෙකක්<br>සඳුන් දැව<br>පර්සියන් බැටලුවන් දෙදෙනෙකු හා තවත් සතුන් කිහිප දෙනෙකු | රන් මාලයක්<br>මුද්දක්<br>රන් පා වැසුම් බඳනයක් |



දෙවන රාජසිංහ රජු



ස්පිල්බර්ජන් පළමු වන විමලධර්මසූරිය රජු මුණ ගැසීම

# දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන් අතර පැවති සබඳතා

- දෙවන රාජසිංහ රජු පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමේ අරමුණින් ලන්දේසීන්ගේ සහය ලබා ගැනීමට කටයුතු කළේ ය.

- දෙවන රාජසිංහ රජතුමා 1638 වර්ෂයේ මැයි මස දී ලන්දේසීන් සමඟ ගිවිසුමක් අත්සන් කළේ ය.

**1638 ගිවිසුමේ ප්‍රධාන කරුණු**

- පෘතුගීසීන් මෙරටින් නෙරපා හැරීමට උඩරට රජුට සහාය දීමට ලන්දේසීන් එකඟවීම.

- පෘතුගීසීන්ට එරෙහි සටන් සඳහා ලන්දේසීන්ට වැය වන මුදල් කුරුඳු, ගම්මිරිස්, මී ඉටි ආදි වෙළෙඳ ද්‍රව්‍ය ලබාදීම මගින් පියවීමට රජු එකඟ වීම.

## 1638 ගිවිසුමේ ප්‍රධාන කරුණු

- ඇතුන් හැර උඩරට සෙසු වෙළෙඳ ද්‍රව්‍ය මිල දී ගැනීමේ ඒකාධිකාරී අයිතිය ලන්දේසීන්ට ලබා දීම.

- රජු අදහස් කරන්නේ නම් පෘතුගීසීන්ගෙන් අල්ලා ගන්නා බලකොටුවල ලන්දේසි හමුදාව නතර කරවීමට එකඟවීම.

- 1638 ගිවිසුමෙන් පසුව 20 වසරක කාලසීමාව තුළ ත්‍රිකුණාමලය, මීගමුව, ගාල්ල, කළුතර, කොළඹ, මන්නාරම හා යාපනය ඇතුළු බලකොටු යටත් කිරීමට ලන්දේසීන් හා උඩරට හමුදාවන් කටයුතු කිරීම.

- අල්ලා ගනු ලබන බලකොටුවල "ලන්දේසි හමුදා නතර කළ යුතු වන්නේ උඩරට රජු කැමති නම් පමණි" යන වගන්තිය අමතක කරමින් ලන්දේසීන් කටයුතු කිරීම.

- ජෙරාඩ් හල්ෆ්ට් නම් සෙනෙවියාගේ මෙහෙයවීමෙන් පෘතුගීසීන්ගේ කොළඹ කොටුව යටත් කර ගැනීම.

- වර්ෂ 1659 - 1668 කාලයේ දී එතෙක් උඩරට යටතේ පැවති නැගෙනහිර හා බස්නාහිර වෙරළබඩ ප්‍රදේශ කිහිපයක් ලන්දේසීන් විසින් අල්ලා ගැනීම.

- වර්ෂ 1670 සිට දෙවන රාජසිංහ රජතුමා එල්ල කළ ප්‍රහාර මාලාවක් මගින් 1658 වර්ෂයෙන් පසු ලන්දේසීන් අල්ලාගත් සියලු ම ප්‍රදේශ යලි අත්පත් කර ගැනීම.

- පෘතුගීසීන් වෙනුවට එවැනි ම වෙනත් යුරෝපීය ජාතියක් ගෙන්වා ගැනීම නිසා ‘ඉගුරු දී මිරිස් ගත්තා වැනි ය’ යන ප්‍රස්ථාව පිරුළක් නිර්මාණය වීම.

# සාමකාමී ප්‍රතිපත්තිය හා ගැටුම්වලින් වැළකීම

- දෙවන රාජසිංහ රජුගේ ඇවෑමෙන් පසුව බලයට පත් ඔහුගේ පුත්‍ර වූ දෙවන විමලධර්මසූරිය රජු ලන්දේසීන් සමඟ සාමකාමී ප්‍රතිපත්තියකට එළඹුණි.

- ඒ සම්බන්ධයෙන් දෙපාර්ශවය අනුගමනය කළ ක්‍රියාමාර්ග කිහිපයකි.

  - පහළ බුරුමයෙන් උපසම්පදා භික්ෂූන් ගෙන්වා ගැනීමට ලන්දේසි නැව් ලබා දීම.
  - පිටිගල් කෝරළයේ කුරුඳු තැලීමට ලන්දේසීන්ට පනවා තිබූ තහනම ඉවත් කිරීම.
  - රජුගේ කුරුඳු, පුවක්, ඇතුන් වෙළෙඳ සමාගම මගින් මිල දී ගැනීමට එකඟ වීම.

# ලන්දේසීන් උඩරට ආක්‍රමණය කිරීම

- ක්‍රි. ව. 1762 පමණ වන විට උඩරට රාජ්‍යය සහ ලන්දේසීන් අතර නැවතත් ගැටුම් ආරම්භ වීම
- වර්ෂ 1762 දී ලන්දේසීන් බැරන් වැන් එක් ආණ්ඩුකාරවරයාගේ මෙහෙයවීම මත උඩරට ආක්‍රමණය කිරීම
- වර්ෂ 1765 දී නැවත වරක් ලන්දේසීන් උඩරට ආක්‍රමණය කිරීම

- කීර්ති ශ්‍රී රාජසිංහ රජු සහ ලන්දේසි ආණ්ඩුකාර විලෙම් පැලක් අතර ලන්දේසීන්ට වාසි සහගත කොන්දේසි මාලාවක් සහිත ගිවිසුමක් අත්සන් කිරීම


### 1766 ගිවිසුමේ වගන්ති කිහිපයක්

- යාපා පටුන, මන්නාරම, කල්පිටිය, කොළඹ දිසාව, ගාලු කෝරලය හා ත්‍රිකුණාමලය අවට ප්‍රදේශ ලන්දේසීන්ට අයත් ය.
- මුහුදුබඩ සිට රට තුළට සිංහල ගව්වක ප්‍රමාණය ලන්දේසීන්ට අයත් ය

# ලන්දේසීන්ගේ පාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික කටයුතු

- දිවයිනේ ලන්දේසි පාලන ප්‍රදේශ කොමාන්ඩරි තුනක් යටතේ පාලනය කිරීම
  - (01) කොළඹ කොමාන්ඩරිය
  - (02) ගාලු කොමාන්ඩරිය
  - (03) යාපනය කොමාන්ඩරිය

- ලන්දේසීන් යටතේ පාලන කටයුතු වඩාත් විධිමත් අයුරින් සංවිධානය වී තිබුණි


VOC සමාගමේ
අධ්‍යක්ෂ මණ්ඩලය
බතාවියේ ආණ්ඩුකාරවරයා
හා උපදේශක සභාව
ශ්‍රී ලංකාවේ ආණ්ඩුකාරවරයා
හා උපදේශක සභාව
(කොළඹ)
කොමදෝරු
ගාල්ල
කොමදොරු
යාපනය
සිවිල් පාලනය
හමුදා කටයුතු
වෙළෙඳ අංශය
දිසාවෙවරයා
කපිතාන්වරු
ඔපර් හූෆ්ට්
ජ්‍යේෂ්ඨ වෙළෙන්දා
මුදලිවරු
(විවිධ සේවා)
කෝරාල
හූෆ්ට්මන්
ඉඩම් ආදායම් භාර
විදානෙවරු
(කුරුඳු තලන්නන්ගේ)
මුදලි/අතුකෝරාල
ගම් මුලාදෑනිවරු

- දිසාවේ තනතුරු සඳහා ලන්දේසි ජාතිකයන් පත් කෙරුණු අතර සිවිල් පාලනයේ පහළ තනතුරු සඳහා දේශීය නිලධාරීන් යොදවා ගැනීම.

    උදා - කෝරාළ, මුදලි, විදානේ, ගම්මුලාදෑනි, අධිකාරි, කංකානම්, උඩයාර්

- නව උසාවි පද්ධතියක් හඳුන්වා දීම.

    (01) රාද්වැන් ජස්ටිට්/මහාධිකරණය

    (02) සිවිල්රාද්/සිවිල් උසාවිය

    (03) ලෑන්රාද්/ඉඩම් උසාවිය

    (04) පිස්කල් උසාවි/දිසාවේ උසාවි/ගම්පති උසාවි

# ලන්දේසීන්ගේ ආර්ථික කටයුතු

- කුරුඳු වගාව සම්බන්ධයෙන් පැවති **මහබද්දේ දෙපාර්තමේන්තුව** ලන්දේසීන් විසින් වෙනම කපිතාන්වරයෙකු යටතට පත් කොට වඩා කාර්යක්ෂම කිරීම

- **පුවක්, මුතු, ඇත් දළ, ගම්මිරිස්, සාදික්කා, එනසාල්, මී ඉටි** වැනි ද්‍රව්‍ය හා ඇතුන් වෙළෙඳාම මගින් ආදායම් ඉපයීම

- ඉඩම්වලින් බදු අය කිරීම

  * ඉඩම්වල අයිතිය හා අය කළ යුතු බදු ආදී විස්තර ඇතුළත් **තෝම්බු** නමින් හැඳින් වූ ලේඛන වඩා විධිමත් කිරීමට කටයුතු කිරීම.

**ලන්දේසීන්ගේ ඉඩම් තෝම්බුවක සඳහන් වූ කරුණු**

❖ රත්මලානේ ගම, දොන් බස්තියන් අප්පුහාමිට අයිති දොඹගහවත්ත ඉඩම, පොල් ගස් ගණන 195 යි. අය විය යුතු බද්ද රික්ස් ඩොලර් 1 ස්ටයිවර් 24 යි.

- මුතුරාජවෙල අස්වැද්දීමට කටයුතු කිරීම.
- යෝධ වැව හා කන්තලේ වැව ආදී වැව් ප්‍රතිසංස්කරණය කිරීම මගින් වී නිෂ්පාදනය වැඩි කිරීමට උත්සාහ කිරීම.
- උක්, ගම්මිරිස්, එනසාල්, කෝපි, මල්බෙරි, ඉන්ඩිගෝ ආදි වගාවන් දියුණු කිරීම.
- රෙදි විවීම, රෙදි සායම් කිරීම, උළු ගඩොල් වැනි කර්මාන්ත දියුණු කිරීම.
- හැමිල්ටන් ඇළ වැනි ඇළ මාර්ග ඉදි කොට ඒවා භාණ්ඩ ප්‍රවාහනයට යොදා ගැනීම.
- යාපන ප්‍රදේශයේ දුම්කොළ වගා කරවීම හා තල් ගස් කඳන් වශයෙන් අපනයනය කිරීම.



හැමිල්ටන් ඇළ

# සමාජ සහ සංස්කෘතික කටයුතු

## ආගමික ප්‍රතිපත්තිය හා අධ්‍යාපන කටයුතු

- රෙපරමාදු ආගම ව්‍යාප්ත කිරීම
- ආගම් ප්‍රචාරය කිරීම සඳහා ඉස්කෝල නම් ආයතන විශේෂය ආරම්භ කිරීම
- ක්‍රි ව 1739 දී ලන්දේසීන් විසින් මුල්වරට මෙරටට මුද්‍රණ යන්ත්‍රයක් ගෙන ඒම

# ලන්දේසි පාලනයේ සමාජ සහ සංස්කෘතික බලපෑම්

- රෝම ගෘහ නිර්මාණ ශිල්පය අනුගමනය කරමින් ඉස්තෝප්පුව, සොල්දරය, කුළුනු හා උස් වහල යෙදූ නිවාස ඉදි කිරීම
- විවිධ ආහාර වර්ග රාශියක් හඳුන්වා දීම උදාහරණ – කේක්, අච්චාරු, කොකිස්
- උසාවි ක්‍රමය හඳුන්වා දීම
- මෙරට සමාජයට බර්ගර් (ලංසි) ජනතාව එකතු වීම
- සිංහල හා දෙමළ භාෂාවලට ලන්දේසි වචන විශාල ප්‍රමාණයක් එකතු වීම



ශ්‍රී ලංකාවේ ඕලන්ද ගෘහ නිර්මාණ




ඕලන්ද පිඟානක් සහ කාසියක්

# සිංහල හා දෙමළ භාෂාවලට එකතු වී ඇති ලන්දේසි වචන

| ගෘහනිර්මාණ හා ගෘහ භාණ්ඩ | නීති ක්‍රමය හා උසාවි | වෙනත් |
| --- | --- | --- |
| සොල්දර<br>තරප්පු<br>බාල්ක<br>ජනේල<br>කාමර<br>ඉස්තෝප්පු<br>ඉස්කුරුප්පු<br>අල්මාරි | නොතාරිස්<br>තෝල්ක | වෙන්දේසි<br>ඉස්කෝල<br>කුච්තාන්සි<br>කන්තෝරු<br>ඔප්පු<br>බූදල් |

## සවියෙන් පෙරට අපි එකට
## ඉ - ඉගෙනුම් පාසල
## හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | ඉතිහාසය | 1 | 1. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් යටතට පත්වීම<br>ඇගයීම |

සැකසුම - කේ.යූ.ජී.අයි.යූ. කාරියවසම්
බප/හො/සාගරපලන්සූරිය ම.වි

(01) ලන්දේසීන් ආසියාවට පැමිණීමට බලපෑ ප්‍රධානතම හේතුව කුමක් ද?

(02) ලන්දේසි වෙළෙඳ සමාගම් කිහිපයක් එකතු කොට පිහිට වූ සමාගම කුමක් ද?

(03) සාමකාමී ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ අරමුණෙන් ලන්දේසීන් සහ උඩරට රජු අනුගමනය කළ ක්‍රියා මාර්ග 03 ක් නම් කරන්න.

(04) මෙරට තුළ ලන්දේසීන් විසින් පිහිට වූ කොමාන්ඩරි 03 කුමක් ද?

(05) ලන්දේසීන් විසින් හඳුන්වාදුන් නව උසාවි පද්ධතියට අදාළ නිදසුන් 04ක් ලියා දක්වන්න.

(06) ලන්දේසීන්ගේ ආර්ථික කටයුතු යටතේ ඔවුන් විසින් මෙරට තුළ ක්‍රියාත්මක කළ නව ක්‍රියාමාර්ග 05 ක් නම් කරන්න.

(07) ශ්‍රී ලංකාව තුළ ලන්දේසීන් ව්‍යාප්ත කළ ආගම කුමක්ද?

(08) ලන්දේසි පාලනයේ සමාජ හා සංස්කෘතික බලපෑම් කරුණු 03 ක් ඔස්සේ ලියා දක්වන්න.

# සවියෙන් පෙරට අපි එකට
# e - ඉගෙනුම් පාසල
# හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | ඉතිහාසය | 1 | 1. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් යටතට පත්වීම<br>පිළිතුරු |

සැකසුම - කේ.යූ.ජී.අයි.යූ. කාරියවසම්
බප/හො/සාගරපලන්සූරිය ම.වි

(01) ස්පාඤ්ඤයේ රජ වූ දෙවන පිලිප් රජු විසින් ලන්දේසීන් ලිස්බන් වරායට පැමිණීම තහනම් කිරීම හේතුවෙන් ඔවුන්ගේ වෙළෙඳාමට අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙනි.

(02) VOC සමාගම

(03) * පහළ බුරුමයෙන් උපසම්පදා භික්ෂූන් ගෙන්වා ගැනීමට ලන්දේසි නැව් ලබා දීම.

* පිටිගල් කෝරලයේ කුරුඳු තැලීමට ලන්දේසීන්ට පනවා තිබූ තහනම ඉවත් කිරීම.

* රජුගේ කුරුඳු, පුවක් ඇතුන් වෙළෙඳ සමාගම මගින් මිල දී ගැනීමට එකඟ වීම.

(04) කොළඹ, ගාල්ල, යාපනය

(05) රාද් වැන් ජස්ටිටි, සිවිල් රාද්, ලෑන් රාද්, පිස්කල් උසාවි, දිසාවේ උසාවි, ගම්පති උසාවි

(06) * මුතුරාජවෙල අස්වැද්දීමට කටයුතු කිරීම.

* යෝධ වැව හා කන්තලේ වැව ආදී වැව් ප්‍රතිසංස්කරණය කිරීම මගින් වී නිෂ්පාදනය වැඩි කිරීමට උත්සාහ කිරීම.

* උක්, ගම්මිරිස්, එනසාල්, කෝපි, මල්බෙරි, ඉන්ඩිගෝ ආදි වගාවන් දියුණු කිරීම.

* රෙදි විවීම, රෙදි සායම් කිරීම, උළු, ගඩොල් වැනි කර්මාන්ත දියුණු කිරීම.

* හැමිල්ටන් ඇළ වැනි ඇළ මාර්ග ඉදි කොට ඒවා භාණ්ඩ ප්‍රවාහනයට යොදා ගැනීම.

(07) රෙපරමාදු ආගම

(08) * රෝම ගෘහ නිර්මාණ ශිල්පය අනුගමනය කරමින් ඉස්තෝප්පුව, සොල්දරය, කුලුනු හා උස් වහල යෙදූ නිවාස ඉදි කිරීම.

* උසාවි ක්‍රමය හඳුන්වා දීම.

* මෙරට සමාජයට බර්ගර් ජනතාව එකතුවීම.